**බිබිල ප්‍රාදේශීය සභාව**
**මොණරාගල දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 14 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 29 වැනි දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 සැප්තැම්බර් 10 වැනි දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

### 1.2 <u>මතය</u>

සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ කාර්යයන් සඳහා ලබාගත් රු.110,654 ක් වටිනා අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩ කාමර කුලී ගිණුමේ වූ ශේෂය රු.636,579 ක් වූ අතර, ලෙජරය අනුව රු.728,335 ක් ලෙස ගිණුම් තැබීමෙන් රු.91,756 ක කඩ කාමර කුලී වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) 2004 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ටෙන්ඩර් මත බදු දුන් මස් සහ මාළු කඩ වලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.277,986 ක් හිඟ බදු මුදලක් අයකර ගෙන නොතිබූ අතර එය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු උඩුබුබුල විවේකාගාරයේ වටිනාකම තක්සේරු කර, ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශණ අනුව ශේෂයන්ගේ එකතුව රු.198,566,551 ක් වූ අතර, ලේඛන අනුව ශේෂය රු.11,904,127 ක් විය.

#### 1.3.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.187,845,460 ක් වූ වත්කම් විෂයන් 02 ක් හා රු.38,414,995 ක් වූ වගකීම් විෂයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (i) වගන්තියේ විධිවිධාන වලට පටහැනිව පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව පුද්ගලයන් නවදෙනෙකු සේවයට බඳවාගෙන සභා අරමුදලින් රු.855,943 ක් ගෙවා තිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,959,401 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,871,558 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ අඩුවීම රු. 2,912,157 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **වරිපනම් බදු**

(අ) 2010 වර්ෂය අවසානයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාලපරිච්ඡේදය තුළ වරිපනම් බදු හිඟ ආදායම රු.2,010,809 සිට රු.4,669,363 දක්වා වැඩිවෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2011 වර්ෂය හා 2012 වර්ෂය අවසානයට වූ හිඟ වරිපනම් බදු අය කරගැනීමේ ප්‍රගතිය සියයට 11 සිට 17 දක්වා අඩු මට්ටමක පැවැතුණි.

(ඇ) රජයේ ආයතන 05 කින් හිඟ වරිපනම් බදු වූ රු.209,639 ක් දීර්ඝ කාලයක් තිස්සේ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.39,189,970 ක් වූ හිග ආදායම් අයකර ගෙන නොතිබුණි.

2.2.2 **බදුකුලී**

(අ) 2013 දෙසැම්බර් 31 දිනට සභාව සතු බස් නැවතුම්පල නව සාප්පු සංකීර්ණයෙහි කඩ කාමර 06 කින් රු.580,350 ක හිඟ බදු මුදලක් අය කරගෙන නොතිබුණි.

(ආ) පොදු වෙළඳපල ගවමස් කඩය 2013 වර්ෂයට වඩා 50% ප්‍රතිශතයකින් බදු වැඩි කර රු.1,521,075 ක් 2014 වර්ෂය සඳහා බදු දීමට 2013 සැප්තැම්බර් 20 දින තීරණය කර තිබුණි. මේ වෙනුවෙන් අවස්ථා 03 කදී ලබා ගත් මිල ගණන් විගණනයට ඉදිරිපත් නොවූ අතර, එම මුදලට බදු දීමක් ද සිදුව නොතිබුණි. 2014 ජනවාරි 17 දින සභාව විසින් ගත් තීරණය මත ඉල්ලීම් සියල්ල ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව 2014 වර්ෂය සඳහා ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) බස් නැවතුම්පල පොදු වැසිකිළිය 2013 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ සුභ සාධන සංගමයට රු.16,485 මාසික බදු මුදලකට බදු දී තිබුණි. එහි වූ ගිවිසුමේ 6 ඡේදය ප්‍රකාරව මාසික ජල හා විදුලි බිල්පත් ගිවිසුම්ගත සංගමය මඟින් නිරවුල් කළ යුතු වුවත්, රු.24,137 ක විදුලි ගාස්තුවක් සභාව මඟින් ගෙවා තිබුණ අතර, ජලය සඳහා වෙනම ජල මනුවක් ද සවිකර නොතිබුණි.

(ඈ) උඩුබුබුල විවේකාංගනය 2012 නොවැම්බර් 01 දින සිට 2014 ඔක්තෝබර් 31 දක්වා විවිධ බදුකරුවන් වෙත බදු ගිවිසුම් මත බදු දී තිබුණි. එහි වූ ගිවිසුම් වල විධිවිධාන වලට පටහැනිව විදුලි ගාස්තු වශයෙන් රු.14,289 ක් සභාව මඟින් ගෙවා තිබුණු අතර, රු.12,444 ක හිඟ බදු ගාස්තුවක් ද අය කරගෙන නොතිබුණි.

(ඉ) පොදු වෙළඳපල කඩ කුලී ගිවිසුමේ 1.4 කොන්දේසිය ප්‍රකාරව මාසයේ 10 වන දිනට හෝ ඒ දිනට පෙර මාසික කඩ කුලී ගෙවිය යුතු වුවත්, එසේ නොගෙවන ලද කඩ හිමියන්ගේ හිඟ කඩ කුලී හා ප්‍රමාද ගාස්තු රු.188,090 ක් අය වී නොතිබුණි.

2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 2,388,287 |
| මුද්දර ගාස්තු | 1,487,296 |

2.2.4 <u>වෙනත් ආදායම්</u>

සමාලෝචිත වර්ෂය අවසානයට කනුල්වෙල නගරයේ මුහුදු මාළු අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම වෙනුවෙන් ලැබිය යුතු රු.12,000 අය කරගෙන නොතිබූ අතර, බදුකරු සමඟ ගිවිසුම් ඇති කරගෙන නොතිබුණි.

2.3 <u>අධිභාර</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(3) වගන්තියේ විධි විධාන යටතේ වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් පනවන ලද අධිභාර අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු.16,287 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවට අයත් බහුකාර්යය ගොඩනැගිල්ලේ පිහිටි කඩ කාමර 05 බදු දීමට කටයුතු කර නොතිබූ අතර, ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය සහ පොලිය මාසිකව ගෙවීමට තිබියදීත් සභාවට ආදායමක් ලබාගත හැකි දේපල බදු දී නොතිබුණි.

(ආ) විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2.1 වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කළ යුතු වුවත්, එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේදී මේ සඳහා සභා අරමුදලෙන් රු.378,736 ක් වියදම් දරා තිබූ අතර වීථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය, සවි කළ යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යනාදිය පිළිබඳව මෙම ලිපිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) බහුකාර්යය ගොඩනැගිල්ලට උපකරණ සැපයීම සඳහා එක්තරා පෞද්ගලික සමාගම සමඟ රු.4,411,143 ක ගිවිසුමකට සභාව 2013 ජූනි 13 දින එළඹ තිබුණි. මින් රු.3,087,800 ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර වලින් ද තවත් රු.1,014,563 ක් දේශීය ණය හා සංවර්ධන අරමුදලින්ද ඉතිරි මුදල රු.308,780 ක් සභා අරමුදලින් ද දරා තිබුණි. උපකරණ මිලදී ගැනීමට 2012 මාර්තු 10 දින මිල ගණන් කැඳවා අඩුම මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර තිබියදී එම තීරණය ක්‍රියාත්මක නොකර නැවත මිල ගණන් කැඳවා සියලුම උපකරණ එම ආයතනයෙන්

මිලදී ගැනීමට තීරණය කර තිබූ නමුත් තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ, ඇගයීම් කමිටුවේ සභාපති පමණක් අත්සන් කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට සභාවේ අනුමත සැලසුම් වලට පරිබාහිරව අනවසරයෙන් පවත්වාගෙන ගිය කඩ කාමර 13 ත් සම්බන්ධයෙන් 2014 මාර්තු 05 වන දිනය වන විටත් නීතිමය පියවර ගෙන තිබුණි.

(ඉ) බහුකාර්යය ගොඩනැගිල්ලේ වේදිකාව සකස් කිරීම සඳහා ගස් හෙළීම සහ දැව කඳන් ඉරීම වෙනුවෙන් සභා අරමුදලින් රු.235,925 ක වියදමක් දරා තිබුණු අතර, කොස් ගස් හෙළීම සඳහා ලබාගත් බලපත්‍රය, ගස්වල ප්‍රමාණය, උස දක්වන වාර්තාව, ඉරන ලද දැව ප්‍රමාණය සහ ඉතිරි දැව ප්‍රමාණය ආදී විස්තර විගණනයට ඉදිරිපත් නොවීය.

3.2 <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

2009 පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.1,484,376 ක් ද සභා අරමුදලින් රු.94,915 ක වියදමක්ද දරා තිබුණි.

රු.1,579,291 ක වියදමක් දරා තිබුණද කොම්පෝස්ට් පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. කසල බැහැර කිරීමේ කටයුතු පරිසරයට හිතකර ආකාරයට සිදු වී නොතිබූ අතර, මධ්‍යම පරිසර සංවර්ධන අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය යටතේ තවදුරටත් මෙම ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා සකස් කර ඉදිරිපත් කර තිබුණද, ඒවා කඩිනමින් ක්‍රියාත්මක වී නොතිබුණි.

4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

<u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් පිළියෙල කර තිබූ අයවැය ලේඛනය මඟින් ඇස්තමේන්තු කළ ආදායම්, වියදම් හා වර්ෂයේ තථ්‍ය ආදායම්, වියදම් අතර පෙන්නුම් කෙරෙන සැලකිය යුතු විචලනයන් අනුව ආදායම් හා වියදම් පාලනයේදී අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය